# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2188/19 - 2020 අගෝස්තු මස 12 වැනි බදාදා - 2020.08.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DS/GFG/L&L/5/98.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ*
*අංකය* : 4-3/11/2017/UD/170.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගාල්ල මහ නගර සභා සීමාව තුළ 98 මඩවලමුල්ල දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මඩවලමුල්ල දකුණ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 810023 දරන කැඩැස්තර පිඹුරේ, කලාප අංක 03 හි පත්‍ර අංක 06හි කැබලි අංක 231 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0018 ක් වූ පහත නම් වලින් හා මායිම් වලින් යුත් බිම් කොටස් සඳහා මායිම්:

**කැබලි අංක 231**

ඉඩමේ නම: වෙල්ලඹගලඅද්දර ඕවිට; හිමිකම් කියන අය: රජය; ඉඩම් පරිහරණය: ගෙවත්ත; මුල් හිමිකම් පාන්නා: එන්. බී. ඒකනායක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0018 ක් පමණ වේ.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2020.08.24 වැනි දින පෙ.ව. 9.00 ට ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2020.08.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයි. හිමාලි රත්නවීර,
ප්‍රාදේශීය ලේකම්,
කඩවත් සතර - ගාල්ල.

2020 අගෝස්තු මස 04 වැනි දින,
ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-566